# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1993 අංක 9 දරන
# ගුවන් හමුදා
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1993 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන **කොටසේ** අතිරේකයක් වශයෙන් පළ **කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : ශත 45 යි.** තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1993 අංක 9 දරන ගුවන් හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 10/91

## ගුවන් හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:— **ප්‍රඥප්ති නාමය.**

1. මේ පනත 1993 අංක 9 දරන ගුවන් හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**359 වන අධිකාරයේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගුවන් හමුදා පනතේ 27 වන වගන්තිය, එහි (අඅ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් මෙසින් සංශෝධනය කරනු ලැබේ:—

"(අඅඅ) (i) නිශ්චිත වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු ඔහු සිය ධුරයේ කටයුතු කිරීමෙන් අත්හිටුවනු ලැබුවේ යම් කාලසීමාවක් තුළද ඒ කාලසීමාව සම්බන්ධයෙන් වූ සියලු වැටුප් සහ දීමනා; සහ

(ii) වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු, ඔහු සිය ධුරයේ කටයුතු කිරීමෙන් අත්හිටුවනු ලැබුවේ එක් එක් මාසයේ යම් කාලසීමාවක් තුළද නියම කරනු ලැබිය හැකි එම මාසය සඳහා වූ ඔහුගේ වැටුපෙන් සහ දීමනා වලින් කොටස.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙසින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපවගන්තියේ (අඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(අඅඅ) (i) නිශ්චිත වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හා විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු, ඔහු සිය කාර්යවලින් ඔහු අත්හිටුවනු ලැබුවේ යම් කාලසීමාවක් තුළ ද, ඒ කාල සීමාව සම්බන්ධයෙන් සියලු වැටුප් සහ දීමනා; සහ

— ඩී 024937—5.705 (92/10)

(ii) වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු, ඔහු සිය කාර්යවලින් අත්හිටුවනු ලැබුවේ එක් එක් මාසයේ යම් කාලසීමාවක් තුළ ද නියම කරනු ලැබිය හැකි ඒ මාසය සඳහා වූ ඔහුගේ වැටුපෙන් සහ දීමනාවලින් කොටසක් ;".

සහ

(2) එම උපවගන්තියේ (1) වන අතුරු විධානයේ " එවැනි අඩුකිරීම්වල මුළු මුදල " යන වචන වෙනුවට " මේ උප වගන්තියේ (අ), (අඅ), (අඅඅ) (ii), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) ඡේදවලින් බලය දී ඇති එවැනි සියලු අඩුකිරීම්වල මුළු මුදල " යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 255, **රජයේ** ප්‍රකාශන **කාර්යාංශයේ** අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව **එළඹෙන එක් එක්** වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.